# මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට ප්‍රතිමාඝරයේ වාස්තුවිද්‍යා ලක්ෂණ සහ වර්තමාන තත්වය පිළිබඳ අධ්‍යයනයක්

බී.ආර්.අයි.වී. බෝරදෙනිය

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
Imeshavinodani332@gmail.com

**මුඛ්‍ය පද** : රජමහා විහාරය, ටැම්පිට ප්‍රතිමාඝර, වාස්තු විද්‍යාව

**හැඳින්වීම**

මහනුවර යුගයේ වාස්තුවිද්‍යාව පිළිබඳව විමසීමේ දී මෙකල ජනප්‍රිය වාස්තුවිද්‍යාත්මක අංගයක් ලෙස ටැම්පිට ප්‍රතිමාඝර හඳුනාගත හැකි ය. මෙම යුගයේ දී රට පුරාම ටැම්පිට ප්‍රතිමාඝර රැසක් ඉදිකර ඇත. ටැම්පිට විහාර යනු කුඩා ප්‍රමාණයේ ගල් කණු මත ශක්තිමත් දැව බාල්ක තබා ඒ මත ලෑලි අතුරවා බිත්ති බැඳ සාදන ලද පිළිම ගෙවල්ය. ස්වාභාවික ආපදා හා කෘමි සතුන්ගෙන් ප්‍රතිමාඝරයට සහ එහි බිතුසිතුවම් වලට සිදුවන හානිය වලක්වා ගැනීමට මෙම සම්ප්‍රදායයේ විහාර ඉදිකර ඇත. සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ සහිතව ඉදිකරන ලද ටැම්පිට ප්‍රතිමාඝර වැඩි වශයෙන් ඉදිවී ඇත්තේ සබරගමු පළාත තුළයි. මහනුවර යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර කලාව ප්‍රතිමාකරණය සහ වෙනත් සංස්කෘතික ලක්ෂණ රැසක් මනාව පෙන්නුම් කරන මැදිලිය ටැම්පිට ප්‍රතිමාඝරයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ සහ එහි වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනය මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ.

**ක්‍රමවේදය**

ඉහත පර්යේෂණ අරමුණ සඳහා පර්යේෂණ ක්‍රමවේදයන් ලෙස ක්ෂේත්‍ර ගවේෂණ සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රම යොදා ගත් අතර පූර්ව පර්යේෂණ දත්ත විමර්ශනය කිරීමෙන් පසු ක්ෂේත්‍ර ගවේෂණ ලෙස මැදිලිය රජමහා විහාරයට ගොස් ටැම්පිට ප්‍රතිමාඝරය අධ්‍යයනය කර විහාරාධිපති ස්වාමීන් වහන්සේගෙන් තොරතුරු ලබාගැනීම සිදු කරන ලදී. සාහිත්‍යමය ග්‍රන්ථ සහ ද්විතීක මූලාශ්‍රය අධ්‍යයනය කිරීම ආදී ක්ෂේත්‍ර නොවන ගවේෂණ හරහා පර්යේෂණය සඳහා තොරතුරු ලබා ගන්නා ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මැදිලිය රජ මහා විහාරයේ ඇති මෙම ටැම්පිට ප්‍රතිමාගෘහය කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ඉදිකර ඇතැයි සැලකේ. මැදිලිය රජමහා විහාරයේ ස්ථූපයට ඉදිරියෙන් පිහිටා ඇති මෙම ටැම්පිට ප්‍රතිමාඝරය මැදිලිය රජමහා විහාරයේ සුවිශේෂී බව විදහා දක්වයි. මෙම ප්‍රතිමාඝරය අධ්‍යයනය තුළ මහනුවර යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර කලාව ප්‍රතිමාකරණය සහ වෙනත් සංස්කෘතික ලක්ෂණ රැසක් මනාව හඳුනාගත හැකි ය. මැදිලිය ටැම්පිට ප්‍රතිමාඝරය ශිලාමය ටැම්මත විශාල දැව බාල්ක යොදා ඒ මත දැව තට්ටුව අතුරා එහි ඉදිකර ඇත. අඩි 2 1/2 උසකින් ඇති ගල් කණු විස්සක් මත දිග හා හරස් අතට දැව බාල්ක හතරක් දැව කඳන් අටක් යොදා ඒ මත ලෑලි තට්ටුවක් අතුරා ටැම්පිට ප්‍රතිමාඝරය ඉදිකර ඇත. වරිච්චි බිත්ති යොදා සකස් කර ඇති මෙම ප්‍රතිමාඝරය වටා ප්‍රදක්ෂිණා පථයක් ද ඇත. අලංකාර රටාවක් සමග පෙති උළු සෙවිලි කර ඇති ටැම්පිට පිළිම ගෙයට ඇතුළු වන විට හමුවන්නේ ගඩොලින් තැනූ කුළුණු හතරක් මත ඉදිකරන ලද හේවිසි මණ්ඩපය නම් සමචතුරස්‍රාකාර ගොඩනැඟිල්ලකි. විහාරයේ තේවාව සඳහා හේවිසි ගැසීම සිදු කරන්නේ හේවිසි මණ්ඩපයේ සිටයි. මේ තුළින් ටැම්පිට ප්‍රතිමාඝරයට ස්වාභාවික ආපදාවලින් ආරක්ෂාවක් ලබා දෙයි. හේවිසි මණ්ඩපයේ සිට දැවයෙන් කරන ලද කෙටි තරප්පු පෙළකින් ප්‍රතිමාඝරයට පිවිසීමට හැකි ය. ටැම්පිට ප්‍රතිමාඝරයේ වහලය පල හතරකට බෙදා පෙතිඋළු සෙවිලි කර ඇති අතර

ඒ මත මැටියෙන් කරන ලද කොත් දෙකකි. අතීතයේ ජලය රැස්කිරීමට හෝ විහාරයේ සුණු පිරියම් කිරීමට යොදාගෙන ඇතැයි සැළකෙන ගලින් නිමවන ලද වෘත්තාකාර බඳුනක් ප්‍රතිමාඝරයේ දකුණු පසින් දක්නට ලැබේ. ප්‍රතිමාඝරයේ වරිච්චි බිත්තිවල අලංකාර බිතුසිතුවම් ඇද ඇත. මහනුවර බිතුසිතුවම් කලාවේ සියළු ලක්ෂණ සහිත අලංකාර ද්වාරපාල රූප දෙකක්, රහත් රූප, දෙව්වරුන්ගේ සිතුවම්, ලියවැල්, කිඳුරු සිතුවම් සමග වියන් චිත්‍ර රැසක් මෙහි දක්නට ලැබේ.

මෙලෙස ඉතා සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ රැසකින් සමන්විත වූ මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට ප්‍රතිමාඝරය වර්තමානය වන විට නිසි නඩත්තුවක් නොමැති වීම නිසා හායනයට ලක් වෙමින් පවතී. මීට කලකට ඉහත දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මැදිලිය රජමහා විහාරයේ ටැම්පිට ප්‍රතිමාඝරය සංරක්ෂණය කිරීම සිදුකර ඇති අතර මෙහි පැරණි පෙති උළු වෙනුවට නව පෙති උළු යොදා හානියට ලක්ව තිබූ හේවිසි මණ්ඩපය පැරණි ස්වරූපයෙන්ම නිර්මාණය කර ඇත. එසේම පිළිමගෙයි ඇතුළත දුම් බැඳී පැවති සිතුවම් නැවත ප්‍රතිසංස්කරණය කර ඇති නමුත් ඉන්පසු මේ සඳහා නිසි නඩත්තුවක් සිදු වී නොමැත.වර්තමානයේ ප්‍රතිමාඝරයේ වහලය දිරාපත්ව තැනින් තැන අබලන් වී ජලය කාන්දු වීම සිදුවන අතර අධික වාර්ෂික වර්ෂාපතනයක් සහිත ප්‍රදේශයක පිහිටි මෙම පිළිමගෙය හා අවට ප්‍රදේශය නිරන්තරයෙන් තෙතමනය සහිත වේ. මේ හේතුවෙන් ඇතිවන ලවණ බලපෑම නිසා බිත්ති ඉරිතැලීම, බිතුසිතුවම් දුර්වර්ණ වී පතුරු ගැලවීයාම, කුඩු වශයෙන් ඉවත්වීම වැනි හායනයන් සිදුවී ඇත. තෙතමනය නිසා බිත්ති පුස් බැඳී ඇත. එසේ ම සිතුවම් බිත්තිවල ආසන්නයේ වේයන් වැනි කෘමි සතුන් වාසස්ථාන සාදා ඇති අතර ඇතැම් ඒවා නිසි සංරක්ෂණ ක්‍රමවේද නොමැතිව ඉවත් කිරිම නිසා බදාම තට්ටු ගැලවී ගොස් ඇත. සිතුවම් බිත්ති මත කෘමීන් විසින් ගුල් හාරා ඇති ආකාරය දක්නට ලැබේ. බන්ධන මාධ්‍ය ලෙස භාවිතා කර ඇති ද්‍රව්‍ය කෘමීන්ගේ ආකර්ෂණයට ලක් වීම මෙයට හේතුවයි. එසේම මෙය වන්දනා කිරීමට හා නැරඹීමට පැමිණෙන පිරිස් සිතුවම් ස්පර්ශ කිරීම නිසා ඒ මත දහඩිය තැවරීම සිතුවම් බිත්ති දුර්වර්ණ වීමට හේතුවී ඇත. මැදිලිය රජමහා විහාරයේ ඉදිකරන ලද නව පිළිමගෙය නිසා මෙම පැරණි ටැම්පිට ප්‍රතිමාඝරයට තිබෙන අවධානය අඩු වී එය අතහැර දැමීමට ආසන්න තත්ත්වයක පැවතීම ද පිළිමගෙය හායනයට ලක් වීමට හේතුවකි. මෙලෙස වර්ෂාපතනය, තෙතමනය සහ උෂ්ණත්වයේ බලපෑම වැනි පාරිසරික හේතු, කෘමි සතුන්ගේ සහ මානවයාගේ ක්‍රියාකාරකම් තුළින් සිදුවන ජීව විද්‍යාත්මක සහ බිත්ති පුස් බැඳීම වැනි රසායනික හායනකාරකවල බලපෑම් නිසා ටැම්පිට ප්‍රතිමාඝරය සහ බිතුසිතුවම් හායනයට ලක්වෙමින් පවතින බව දක්නට ලැබේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙහි සංරක්ෂණ කටයුතු කළද වර්තමානයේදී කිසිදු නඩත්තුවක් නොමැති වීම සහ විහාරස්ථාන ප්‍රජාවගේ නොසැළිකිල්ල නිසා විනාශයට ලක්වෙමින් පවතී.

මෙම පර්යේෂණය මගින් අණාවරණය වන පරිදි පෞරාණික හා වාස්තුවිද්‍යාත්මක වටිනාකමකින් යුත් මෙම ප්‍රතිමාඝරය විධිමත් සංරක්ෂණ ක්‍රියාවලියක් සහ දීර්ඝකාලීන නඩත්තු ක්‍රියාවලියක් සකස් කර තවදුරටත් විනාශ වීම වළක්වා අනාගතය උදෙසා රැක ගැනීමට බලධාරීන් කටයුතු කළ යුතුය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

පූජ්‍ය ඥාණානන්ද ඉලුක්ගොඩ සහ බණ්ඩාර, ආර්. ඩබ්. පී.,(2011) ***මැදිලිය රජමහා වෙහෙර පුවත,*** මැදිලිය: මැදිලිය රජමහා විහාරය.

බෙල් එච්. සී. පී. (2004) ***කෑගලු වාර්තාව,*** (පරි කොත්මලේ එඩ්මන්. කේ. බී. ඒ.) කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.